# මොලගොඩ කොටමුදුන්ගල රජමහ විහාරය

කේ. බණ්ඩාරනායක



චෛත්‍යයේ දසුනක්



නව විහාර මන්දිරය



පැරණි ලෙන් විහාරය

කන්ද උඩරට සිද්ධස්ථාන වැඩි කොටසක් ඓතිහාසික අතීත් පෞරාණික වටිනාකමක් බවට පත්වූයේ වලගම්බා රජු සමයේ බව සඳහන් කලොත් එහි සත්‍යතාවයක් ඇති බව බෞද්ධ ගවේෂණවලින් හා පැරණි පොතපතින් දක්වා ඇත. වලගම්බා රජතුමා සතුරු උවදුරුවලින් ආරක්ෂා වීම සඳහා දූර්ග මාර්ග ගෙවා වනගතව නතර වූ සෑම තැනම එවැනි සිද්ධස්ථාන රජතුමා අතින් ගොඩනැංවුනි. පසුකලෙක රජමහ විහාර බවට ද පත්වූ එම සිද්ධස්ථාන වටා ලෙන් ආශ්‍රිත විහාර මන්දිර, චෛත්‍ය, ඉදිකෙරුනි. බුද්ධ පූජාව සඳහා හැට පස් අමුණු කෙත් වතු පූජා කෙරුනි. වනාන්තර වැනි ඖෂධ ගස් රෝපනය වුනි.

මෙවැනි කෙත්, වතු පිටි, ඖෂධ වනාන්තර වලින් පිරි, දෙවෙනි දඹුල්ල වශයෙන් බෞද්ධයින් අතර ජනප්‍රවාදයට පත් වළගම්බා රජතුමා විසින් ඉදිකරන ලද රජ මහ විහාරයක් හාරිස්පත්තුවේ, මොලගොඩ පිහිටා ඇත. මොලගොඩ කොටමුදුන්ගල රජමහ විහාරය වශයෙන් ප්‍රසිද්ධ මෙම විහාරය, මහනුවර සිට කුරුණෑගල මාර්ගයේ ගමන් කරන විට, අරඹේකඩේ හංදියෙන් හරංකහව බොක්කාවල මාර්ගයේ කිලෝමීටර් අටක් පමණ යනවිට කඳු ගැටයක් මත චෛත්‍යයක් සහිතව විහාරය ඉදිවී ඇත. ලෙන් ආශ්‍රිත පර්වත මායිම්කර ඉදිකරන ලද විහාරයේ පැරණි බුද්ධ ප්‍රතිමා වහන්සේලා පැරණි තත්ත්වයෙන්ම දක්නට ඇත. වළගම්බා රජතුමාගේ ප්‍රතිමාවක් ද මෙහි පසෙක ඇති අතර ගල් පර්වතය මත පැරණි චෛත්‍ය සමග පැරණි බෝධීන් වහන්සේය. නව චෛත්‍යය මලුවේ වනරොද ආශ්‍රිතව දක්නට ඇත.

වත්මන් විහාරාධිපති මහෝපාධ්‍ය පණ්ඩිත හිඟුල්වල සරණංකර නාහිමි විහාරයේ පැරණි ඓතිහාසිකත්වය ආරක්ෂා කර ගැනීමට සංරක්ෂණ කටයුතු රැසක් මෑතකදී සිදුකර ඇත. ඓතිහාසික අතීත් විශාල වටිනාකමක් මෙන්ම බෞද්ධ සංස්කෘතික දයාදයන් වශයෙන් ද පිළිගත හැකි මොලගොඩ, කොටමුදුන්ගල, රජමහ විහාරය සමග අවට ඇති ඔසු උයන සංරක්ෂණය කරගත යුතු කාලය එළඹ ඇති බව, එය දැක බලා ගත් අයෙකුට වැටහෙනු ඇත.